Living the Lotus

1
2022
VOL. 196

Buddhism in Everyday Life



Founder’s Reflections

# සැමගේ පිහිටෙන් ජීවත්වීමට හැකිව තිබෙන බව වටහා ගැනීම

සියළු දෙනාටම සුභ නව වසරක් වේවා.

1997 වන වසර උදා වුනා. සූත්‍ර පාඨ පොත පෙරළා බැලූ විට ‘උතුම් වූ සියුම් වූ අසිරිමත් ධර්මය, නිමක් නැති කල්පයන්හි කලාතුරකින් දැකිය හැකි වූවකි. අපි දැන් එය දැක්කෙමු. ඇසුවෙමු. ධාරණය කලෙමු. තබා ගත්තෙමු.’ ලෙස සදහන් වේ.

මිනිසුන් දෙවතාවක් උපදිනවා යැයි කියනවා. පලමු ඉපදීම නම්, සැවොම හොඳින් දන්නා පරිදි දෙමව්පියන්ගෙන් ජීවය ලබාගෙන අපි මේ ලෝකයට ඉපදීමයි. එසේම, ධර්මය හා හමු වී, විශ්වයේ මහා ජීව ශක්තියෙන් ජීවය ලබාගෙන, තමා විසින් අධිෂ්ඨාන කරගෙන, මේ ලෝකයට ඉපදුන බව අවබෝධ කර ගැනීම දෙවන උපත ලෙස හැදින්වේ.

මේ ඉපදීම තුලින් මිනිසුන් සදාතනික ජීවයක් ලබා ගනී. එය කොතරම් ස්තූතිවන්ත වියයුතු කාරණයක්දැයි වසර මුලදී නැවත වතාවක් හදවතට බද්ධ කර ගනිමු.

සැමගේ පිහිටෙන් ජීවය ලබා සිටින අපි දෙවන ඉපදීමේ කෘතවේදීත්වය අමතක නොකල යුතුයි. එයට කෘතගුණ සැළකීමට ‘අන්‍යයන් වෙනුවෙන්’ ඇප කැප වී කටයුතු කල යුතුයි. එසේ අන්‍යයන් වෙනුවෙන් කැපවීම ජීවිතයට බද්ධ කරගෙන කටයුතු කරන විට, සෑම දිනක්ම සතුටින් ගතකල හැකිවේ. එමෙන්ම නොදැනුවත්වම සිතට සැක සංකා හෝ කුමන ප්‍රශ්ණයක් බාධකයක් පැමිණියත් ‘ඔව් මට පුළුවන්’ යනුවෙන් ධෛර්යයෙන් යුතුව ජීවිතය ගතකල හැකිවේ.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 11, P. 8-9


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජිවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍ර ධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus
Vol. 196 (January 2022)

Senior Editor: Keiichi Akagawa
Editor: Kensuke Osada
Copy Editors: P.A.D. Somapala,
Ruklanthi Palipana, Sahan Chamara , Rajitha Madurangha

*Living the Lotus* is published monthly
by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international
@kosei-kai.or.jp



# මෙම කාලයට සුදුසුම වදන
# 'අන්‍යයන්ට උපකාර කිරීම' - දනමය ක්‍රියාවලිය 1

නිච්කෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## බුදු දහමේ වැදගත්ම කරුණ

සුබ නව වසරක් වේවා.

තවමත් බිය පහව නොගිය නව කොරෝනා වෛරසයේ වසංගත තත්වය තුලින්, අපට විශාල කරුණු කාරණා ඉගෙන ගැනීමට හැකිවුනා නේද? මේ වසරේදී එම ඉගෙනගත් කරුණු, ප්‍රඥව හා දයාව බවට පත්කරගෙන, සිතට සැනසුම ගෙනෙන පවුලක් හා අවංක සමාජයක් බිහිකිරීමට, කලබලත් නොවී විවේකත් නොගෙන බෝධිසත්වයන් කෙනෙකු සේ ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගනිමු.

එසේනම්, ධර්මය ඉගෙන ගන්නා අපට කියාදෙන වැදගත්ම කරුණ වන, මෙම ආධ්‍යාත්මික දියුණුවේ අරුත කුමක්ද?

ජපානයේ සුප්‍රසිද්ධ තෙන්දයි තයිෂි විසින්, 'අප්‍රසන්න දේ තමා විසින් භාරගෙන, හොද දේ අන්‍යයන්ට ලබාදෙමු. එසේම තමා ගැන අමතක කර, අන්‍යයන්ගේ සතුට ප්‍රාර්ථනා කිරීමයි නියම දයාව වන්නේ' සේ පවසන අතරම, එසේ කිරීමට හැකි බෝධිසත්වයන් ජාතියේ සම්පතක් බව පැහැදිලි කරයි. එනම්, 'තමා ගැන අමතක කර අන්‍යයන්ට සේවය කිරීම' ලෙසින් අන්‍යයන් ගැන සිතමින්, තමාට කලහැකිදේ කරමින් සිතේ සැනසුම හා සතුට ළඟාකර දිම බුද්ධ මාර්ගයේ කියාදෙන වැදගත්ම දනමය ක්‍රියාවයි. එසේම, කුකායි තයිෂි පවසන්නේ, 'බුදුන් වහන්සේ දේශනා කල ධර්මය විශාලය සීමාවකින් තොරය, නමුත් එය එක් වාක්‍යකින් පවසනවා නම්, තම යහපත සලසා ගැනීම මෙන්ම, අන්‍යයන්ට උපකාර කිරීම වේ. මෙහිදී අන්‍යයන්ට උපකාර කිරීම, පාරමිතා වල කියාදෙන දනය වේ. තම යහපත සලසා ගැනීම, තම සත්‍යාවබෝධය වෙනුවෙන් ධර්මය පුහුණු වීමයි ලෙසින් බුදු දහමේ වැදගත්ම කරුණ පැහැදිලි කර දෙයි.

සිදුහත් කුමරු ගිහිගෙය හැරයාමේ අභිප්‍රාය වුවේද, 'ඉපදෙමින් මැරෙමින් මේ සංසාරයේ දුක් විදින්නාවු සියළු සත්වයන්ව, එයින් මුදවා ගැනීම' යි. සක්විති රජ වීමට උරුමකම් තිබුනත්, තම තනතුරු හා වත්කම සියල්ලම හැරදමා සියළු සත්වයන්ව දුකින් මුදවා ගැනීම වෙනුවෙන් බුදුන් වහන්සේ කටයුතු කලා. එසේ අන්‍යයන්ට උපකාර කිරීමේ දනමය ක්‍රියාවලිය තුලින් බුද්ධ මාර්ගයට යොමු වුනා වේ. නමුත්, පාරමිතා වල පලමුවැන්න වන දනය හා ගිහිගෙයි අතහැර යාම අතර සම්බන්ධයක් නැතැයි සිතමි.

එසේම නොයෙකුත් කරුණු කාරණාවල වෙනස්වීම් සිදුවන මෙම කාලයේ, දනමය ක්‍රියාවලිය හා පාරමිතා තුලින් ඉගෙන ගතයුතු වැදගත් දේ කුමක්දැයි කල්පනා කරබලමු.

## ලෝබ නොවී අන්‍යයන්ට උපකාර කරමු

කොරෝනා වෛරසයේ ව්‍යාප්තියත් සමඟම සමාජයේ තිබෙන නොයෙකුත් සීමාවන් හේතුවෙන්, මිනිසුන් එකිනෙකා අතර ශාරීරික හා මානසික දුරස්ථභාවයක් ඇතිවී තිබේ. එසේ වුවත් මෑතක සිට ආගම් වලට සීමා නොවී, ලාභ අලාභ ගැනද නොසලකා අන්‍යයන්ට උදව් උපකාර කිරීම ප්‍රවණතාවයක් බවට පත්ව ඇත. ස්වෙච්ඡා සේවයේ යෙදීම, ජීවත්වන ප්‍රදේශයේ කඩ සාප්පු හා ව්‍යාපාර වලට උදව් කිරීම, අන්තර්ජාලය හරහා මුදල් එකතුකර අපහසුතාවයට පත්ව සිටින අයට උපකාර කිරීම ආදී ලෙසින් තමා ලඟ තිබෙන දේ අන්‍යයන් වෙනුවෙන් ලබාදීම තුලින් ලැබෙන සතුට, සමාජයට වැඩදායි දෙයක් කිරීමට හැකිවුනා යැයි සිතන පිරිස වැඩි වී තිබේ. එලෙසින් මනුෂ්‍යයන්ගේ හදවත පුළුල් හා සමෘද්ධිමත් බවට පත්වීම ඉතා විශිෂ්ට දෙයකි.

‘කොරෝනා ව්‍යසනය’ ලෙසින් කොරෝනා වෛරසය ව්‍යාප්ත වීම හැදින්වුවත්, වෛරසය පැතිරීමත් සමඟම මිනිසුන්ගේ හදවත් එකිනෙකාට උදව් උපකාර කරගත යුතුයි සේ වෙනස්වුනා. ඒ අනුව කොරෝනා වෛරසය හේතු සාධක වී ‘කොරෝනාවේ යහපත් ප්‍රතිඵලයන්’ ලැබුනා යැයි ධණාත්මකව භාර ගැනීමටද හැකිවේ.

බුදු දහමේ දනය, මුල්‍යමය දනය, ධර්ම දනය හා ශාරිරික දනය සේ කොටස් වලට වෙන්කර කියාදෙයි. සමාජයේ යහපත වෙනුවෙන්, අන්‍යයන්ට උපකාර කිරිම හා ස්වෙච්ඡා සේවය සදහා තමන්ට පහසු ආකාරයේ දනමය ක්‍රියාවලියක් එයින් තෝරගත හැකිවෙයි.

දෝගෙන් නම් සෙන් ගුරුතුමා ‘ලෝබ නොවී දනය දෙමු’ යනුවෙන් පවසයි. ලෝබ නොවී තමා ළඟ තිබෙන දේ අන්‍යයන්ට දීමෙන් එය දනමය ක්‍රියාවලියක් බවට පත්වේ. තිරසාර පරිසරයක් හා යහපත් සමාජයක් ගැන සිතන්නේ නම්, අපි එකිනෙකා ලෝබ නොවී දනමය ක්‍රියාවලිය පුහුණු කිරීම තුලින් වඩාත් නවීන සමාජයක ඉඟි ගෙනදෙයි.

අනෙක් අතට මිනිසුන් එකට එක්වී කරන්නාවූ කටයුතු අඩුවීම තුලින්, තමා ඉදිරියේ කරදරයට පත්වූ පුද්ගලයෙකි සිටියත් උදව් කිරීමට පෙලඹීම අඩු වෙනවා යැයි සිතෙනු ඇත. එම නිසාම අන්‍යයන්ට දයාව දැක්වීම වඩා වැදගත් වනසේම, එම හැඟීමෙන් දනමය ක්‍රියාවලිය සිදුකරනවාත් සමඟම, තණ්හාව හා මුල්‍යමය දනය අතර තිබෙන සබධතාව ගැන අපි සියළුදෙනා නැවත කතාබහ කරමු.

From *Kosei*, January 2022.

# පවුලේත් සාමාජිකයගේත් ලෝකයේත් සතුට ප්‍රාර්ථනා කරමින්

කොගනෙයි ධර්ම ශාඛාව

කිනොෂිතා එරිකෝ

මෙම සෙප්පෝව, 2021 වර්ෂයේ 11 වන මස 15 වන දින, නිර්මාතෘ තුමාගේ උපන්දින සැමරුම් උත්සවයේදී මූලස්ථානයේ ප්‍රධාන ධර්ම මන්දිරයේදී ඉදිරිපත් කරන ලද්දකි.

නිර්මාතෘ තුමාගේ ජන්මදින සැමරුම් උත්සවයේදී සෙප්පෝව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන හදවතින්ම ස්තුතිවන්ත වෙමි. මම 1978 වර්ෂයේ, ධර්මයට ලැදි, සීයාත් ආච්චීත් දෙමාපියනුත් සමගියෙන් සිටින පවුලක සහෝදර සහෝදරයන් 04 දෙනෙකුගේ වැඩිමහල් දියණිය ලෙස උපත ලබා, ෆුචූ ධර්ම ශාඛාවේ කියෝකයිචෝ සාන් ඇතුලු සාමාජිකයින්ගේ උණුසුම මැද හැදී වැඩුණා. විශේෂයෙන්ම සංගීත කණ්ඩායමේ කළමණාකරු ලෙස, සෑම අවුරුද්දකම විශාල කණ්ඩායම් සමග ෆුමොන් මන්දිරයට යන අතරතුරදී, එම ළමුන් සමග තරුණ වැඩසටහන් කල යුතුයි කියා දැණුන හැඟීම මුල් කොටගෙන, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වුනා. 2014 දී කොගනෙයි ධර්ම ශාඛාවේ සාමාජිකව සිටි වර්තමානයේ මාගේ මහත්තයා සමග විවාහ වී, ඒත් සමගම මට පවුල් අධ්‍යාපන කණ්ඩායමේ නායක තනතුර ලැබුණා. ඒ කාලයේ සිටි හිරොසෙයි කියෝකයිචෝ සාන්, කිසිවක් නොදන්නා මා සමග තෙදොරි යන්නට පැමිණියා. හැමදෙනාගේම ආශිර්වාදයෙන්, මේ වනවිට පවුල් අධ්‍යාපන කණ්ඩායමේ සාමාජිකයින් සමග විශ්වාසනීයව කටයුතුකරමින් සිටිනවා.

වර්තමානය වනවිට මා, ඉවසිලිමත් මහත්තයාත් දියණියන් දෙදෙනාත් සමග සතුටින් පිරි පවුල් ජීවිතයක් ගතකරමින් සිටිනවා. ගිය වසරේ මගේ මාමණ්ඩිය මිය ගිය අතර, ඔහු මගේ වැඩිමහල් දියණියට බොහෝ ලෙස ආදරය කල අතර, වයස අවුරුද්දක් වත් සපුරා නොතිබූ තම මිණිබිරියට, ‘අනාගතයේදී මගේ නිවස අසලින් නිවෙසක් තනාගෙන ජීවත්වන්න’ ලෙසින් නිතරම පැවසීය. අවුරුද්දකට ඉහතදී, මාමණ්ඩියගේ උපදෙස් පරිදි, දෙමාපියන්ගේ නිවස අසලින්ම හොඳ දවසක් බලා නව නිවසක් ඉදිකිරීමට සූදානම් වී, ගිවිසුම් අත්සන් කළා. ඒත් සමගම කොරෝනා වෛරසය ආරම්භ වූ අතර, එය මගේ පවුලට මහත් කම්පනයක් වුනා. මාමණ්ඩිය රෝහල් ගතව සිටි රෝහලේද, කොරෝනා වෛරසය පැතිරීම හේතුවෙන්, පසුගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේදී මාමණ්ඩියටද වෛරසය ආසදනය වුණා. ඒ වන විටත් එය නව වෛරසයක් වූ බැවින් බෙහෙත් සොයමින් සිටියා. පෙර සිටම මාමණ්ඩියගේ පෙනහළු දුර්වල වු නිසාවෙන්, මාමණ්ඩියට කොරෝනා වෛරසය ආසාදනය වීම, මරණයට නියමවූවාක් මෙන් ලොකු කම්පනයක් වුනා. තනිවම තම වැඩපල කරගත නොහැකි, එකම තැනක සිටින මාමණ්ඩියට කෙලෙස වෛරසය ආසාදනය වූවාදෝ කියා කල්පනාකර මට කලකිරීමක් දැණුනා. රෝහලෙන් සහ මහජන සෞඛ්‍ය නිළධාරී කාර්යාලයෙන් පැමිණෙන ඇමතුම් වලට ප්‍රතිචාර දැක්වීම මහත්තයා බාරගත්තා. රෑකියා වේලාවෙත්, මධ්‍යම රාත්‍රියේත්, දුරකථන ඇමතුම් ලැබෙන විට, ඔහුගේ හෘද ස්පන්දන වේගය වැඩිවන බව මහත්තයා මට පවසා සිටියා.

මම, මාමණ්ඩියට ඉක්මනින්ම සුවවන ලෙසටත්, මහත්තයාට ශක්තියක් වියයුතුයි ලෙසටත්, ප්‍රාර්ථනා කරමින්, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය හදවතින්ම සජ්ජායනා කලා. කෙසේ වෙතත් එලෙස ප්‍රාර්ථනා කරමින්, මගේ පියාගේ අභාවය ගැන අද්දැකීම් සමග සසඳ, මහත්තයාගේ දෙමාපියන් ගැන සැහැල්ලුවෙන් සිතා කටයුතු කර, මහත්තයාට දොස් පවරනු ලැබුවා. ඇත්තටම මා ඒ ගැන පසුතැවුන අතර ඒ පිළිබඳ කොගනෙයි ධර්ම ශාඛාවේ තන්ජි කියෝකයිචෝ සාන්ට පැවසූ විට, ‘සමන්තභද්‍ර බෝධිසත්වයන් මෙනෙහි කිරීම පිළිබඳ සූත්‍රය හදවතින්ම සජ්ජායනා කර ඒ ගැන සමාව ගන්නා’ ලෙසත් එය ඉක්මනින්ම පුහුණු කරන ලෙසත් උපදෙස් ලබා දුන්නා. මා එම දවස තුලදීම එය පුරුදු පුහුණු කලා. ‘ඒ දවස් වල, මගේ පිහිටට කිසිවෙක් නොමැති බවක් හා තනි වූ හැඟීමක් දැණුනා’ ලෙස මහත්තයා එකවරම පවසා සිටියා. ඒ මොහොතේ මා කල වරද වැටහී මටම සමාව දිය නොහැකි බවක් දැණුනා. ඒත් සමගම මම මහත්තයාගේ ලගින් හිද ශක්තියක් විය යුතුයි කියන නව අරමුණක් මා තුල ඇතිවූනා.

එම අවස්ථාවේදී, මෙම හදිසි නීතිය පනවා තිබෙන කාලයේ තරුණ කණ්ඩායම් සාමාජිකයින් හා සම්බන්ධ



මූලස්ථානයේ ප්‍රධාන ධර්ම මන්දිරයේදී සෙප්පෝව ඉදිරිපත් කරන කිනොෂිතා සාන්

වන්නේ කෙසේද, මේ මොහොතේ කල හැක්කේ කුමක්ද යන්න සාකච්චා කළා. සාකච්චාවේ ප්‍රතිඵලයක් ලෙස, පළමු වරට හදීසි නීති පනවා තිබූ කාලයේ, මා සිටිනා ස්ථානය ධර්මය පුරුදු පුහුණු වන ස්ථානය බවට පත් කරගෙන ප්‍රශ්ණ ගැටලු වලට සාමාජිකයන් මුහුණ දුන් ආකාරය පිලිබඳව සාමාජිකයින්ගෙන් තොරතුරු රැස්කරගෙන වීඩියෝවක් නිර්මාණය කිරීමට තීරණය කලා. මම මේ ප්‍රයෝගික පුහුණුව තුලින් ලබාගත් ආනිසංස මාමණ්ඩියටත් ලැබේවා, කියන අරමුණින් වයස අවුරුදු 04 ක් වූ මාගේ වැඩිමහල් දියණිය සමග මේ ක්‍රියාකාරකම සාර්ථක කරගැනීමට මහන්සි වී කටයුතු කලා. මාමණ්ඩිය සිටින රෝහලේ අයට ස්තුතිවන්ත ලියුමක්, කුණු ගෙනියන අයට ස්තුතිවන්ත ලියුමක් කුණු බෑගයේ අලවා, එවාගේම නිවස ඉදිරිපිට පාර්සල් බෙදහරින අයට ස්තුතිවන්ත ලියුමකුත් ලියා තැබුවා. මැයි මාසයේදී, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර සජ්ජායනය සති 03 ක කාලසීමාව ඉක්මවන මොහොතේ, මාමණ්ඩිය සිටින රෝහලෙන් 'මාමණ්ඩියගේ දෙවන PCR පරීක්ෂණය සෘණාත්මක' වන නිසා දැන් මාමණ්ඩියව බැලීමට පුළුවන් ලෙස දුරකථන ඇමතුමක් ලැබී, එම පණිවිඩයෙන් ඉමහත් සතුටට පත් වූ මා මහත්තයා සමග සතුටු කඳුළු සැලුවා. නමුත් මද වේලාවකින් නැවත රෝහලෙන් දුරකථන ඇමතුමක් පැමිණ, 'මාමණ්ඩියගේ හෘද ස්පන්දනය දුර්වලයි' වහාම පැමිණෙන්න ලෙස දැනුම් දුන්නා. නමුත් මා එහි යනවිටත් අවාසනාවන්ත ලෙස හෘද්‍යාබාධයකින් මාමණ්ඩිය මෙලොව හැරගොස් තිබුණා. මසකට ආසන්න කාලයක් ස්වසන ආධාරක යන්ත්‍ර වල ආධාරයෙන් සිටි නිසාවෙන් හදවත යම් දුරකට දුර්වල වී තිබෙන බව වෛද්‍යවරුන්ගෙන් අසන්නට ලැබුණා. ඇත්තෙන්ම එය අවාසනාවන්ත සිද්ධියක් වුවත්, කොරෝනා ධනාත්මක ලෙස මිය ගියානම්, පවුලේ සාමාජිකයින් හමුනොවිම අවසන් කටයුතු කිරීමට සිදුවන්නට තිබුණා. කොරෝනා සෘණාත්මක වූ ආශිර්වාදයෙන්, බිරිඳ හා දරුවන් හමුවීමට හැකියාව ලැබුණා ලෙස සිතූ කළ, මාමණ්ඩිය තුල පවුල කෙරෙහි තිබූ ආදරයේ ගැඹුරු බව හොඳින් දැනෙන්නට වුනා.

අවමංගල්‍යය, මහජන සෞඛ්‍ය නිළධාරී කාර්යාලයේ උපදෙස් පරිදි කලින් ආදාහනය කළ අතර, අළු භූමදනය කලා. 'අවසන් වතාවට මාමණ්ඩියට ඔබගේ ආදරය සහ ස්තූතිය පුද කිරීමට ස්තූතිවන්ත වැකික් ලිව්වොත් කොහොමද' යැයි කියොකයිචෝ සාන් පැවසූ නිසා මම හදවතින්ම ස්තූතිවන්තව එය ලිව්වා. මාමණ්ඩිය, වැඩිය කතාබහ නොකරන පුද්ගලයෙකු වුවත්, කතාකරන සෑම වචනයකින්ම, අපව හොඳින් තේරුම් ගෙන ඉවසීමෙන් කටයුතු කරන මාමණ්ඩියගේ සෙනෙහස හොඳින්ම දැණුනා. අවමංගල්‍ය උත්සවයේදී 'ආදරණීය මාමණ්ඩිය වෙනුවෙන්' ලියූ වැකිය සහ සූත්‍ර සජ්ජායනයක්, මාමණ්ඩියගේ මිනිය ඉදිරිපිට පැවැත්වීමට හැකිවුණා. මගේ නැන්දම්මාත් මා අසලින්ම වාඩි වී කඳුළු සලමින් එයට සවන් දුන්නා. ලේලිය වී ගත වූයේ අවුරුදු 7 ක් වැනි කුඩා කාලයක් වුවත්, තමාගේම කුසින් වැදූ දරුවකුට මෙන් ආදරය ලබාදුන්නා. කිනොශිතා පවුලට ලේලියකු වී පැමිණීමට හැකිවීම ඇත්තටම වාසනාවක්. මින් ඉදිරියටත් නැන්දම්මාව හොඳින් රැක බලාගෙන කටයුතු කිරීමට බලාපොරොත්තු වනවා.

මාමණ්ඩියගේ අවමංගල්‍ය කටයුතු අවසන් කර, සැප්තැම්බර් මාසයේ සොහොන් කොතෙහි වැඩද අවසන් වනවිට, නැන්දම්මාට පිළිකාවක් ඇති බව සොයාගෙන, ඒ සඳහා ඇයට ප්‍රතිකාර සහ සැත්කම් ආරම්භ කලා. අලුත් නිවසට යාමට සූදනම් වන මේ කාලයේම දිගින් දිගටම එන කරදර නිසා, මා කම්පනයට පත්ව හදවතින් කඩා වැටුණා. නැන්දම්මා වෙනුවෙන් මට කල හැකි උපරිමයෙන් කටයුතු කලත්, ඉතා අමාරුවෙන් එදිනෙද ගතකරන නැන්දම්මා ගැන සිතන විට, ගෙවල් මාරු කිරීම තව ටිකක් කලින් කලානම් යමක් කරගන්නට තිබුණානේ ලෙසින්, දැන් නැන්දම්මා වෙනුවෙන් කල හැකි හොඳම දේ කලයුතුයි ලෙසිනුත්, හදවතින් කල්පනා කලා. දිගින් දිගටම ඇයි මේ ලෙසින් කරදරම කියා මා සිතූ විට මගේ බුදුන් වහන්සේ හදවතින් ඉවත් වූවා සේ දැනෙන්නට වුනා. හෝසා තුලදීත්, ඇයි මෙ වෙලාවේම කරදරම සිදු වන්නේ යැයි මැසිවිලි නගමින් සිටි මා හට, කියෝකයිචෝ සාන්, 'මේවෙලාව තමා හොඳම! නැන්දම්මාට හොඳින් සලකන්න පුළුවන්. ළමයි මාව බලන්න ඒවි කියා සිතුවාම, නැන්දම්මාට කෙතරම් ධෛර්‍යක්ද, ජීවත් වීමට කොපමණ බලාපොරොත්තුවක්ද,' යනුවෙන් පහද දුන්නා. එවිට මට ඇස් වලට කඳුළු ඇවිත් මගේ පපුව පැලී යන්නාක් මෙන් දැණුනා. කෙසේ වෙතත් මම බුදුන්ගේ ලෝකයේ ජීවත් වනවා කියා සිහියට නැගී ධනාත්මකව සිතීමට හැකිවුනා. හැමදෙනාගේම ආශිර්වාදයෙන්, නැන්දම්මා වේදනාකාරී ප්‍රතිකාර වලින් පසු රැකගත් ජීවිතයේ ඉතිරි කාලය මුණුබුරන් බලාගන්න ඉඩ දෙන්න ලෙස පවසමින්, එළිමහනේ ඇවිදීමට යන අතරතුර නිවසට පැමිණ දරුවන්ට උණුසුම් වදනින් කතාකරමින් කාලය ගත කරනවා.

මෙම අවුරුදු එකහමාරක කාලය තුල, කොරෝනා නිසා මාමණ්ඩියගේ අභාවය, ලදරු පාසලට ඇතුළත් වීමට නොහැකි වීම නිවෙස් මාරු කරන අතරතුර නැන්දම්මා අසනීප වීම, යන කාරණා මගේ පවුලට ඉමහත් වේදනාවක් ගෙනදුන් සිදුවීම් පෙළක් වූවා. දුක් වේදනාවන්ගෙන් පිරි සිදුවීම් තුල පවා, අනිවාර්යයෙන්ම කෘතවේදී හදවතේ ආලෝකයක් ඇත, යන නිර්මාතෘ තුමාගේ ඉගැන්වීම නොතිබුනානම්, මා හට දුකින් මිදීමට නොහැකිවන්නට ඉඩ තිබුණාකියා සිතනවා. ඉගැන්වීම් නිසාවෙන්, ජීවත් වීමේ වටිනාකම ගැඹුරින් වටහා ගැනිමට හැයාවක් ලැබුණා. මෙම ඉගැන්වීම් ඉගෙනීමට අවස්තාව සලසා දුන් මාගේ සීයා ආච්චීටත්, දෙමාපියන්ටත්, මා අසලින්ම හිඳ සහයෝගය දුන් කොගනෙයි ධර්ම ශාඛාවේ සාමජිකයින්ටත් මාගේ හද පිරි ස්තූතිය පුද කරනවා.

මේ වසරේ, පවුල් අධ්‍යාපන කණ්ඩායමේ, කරුණු 02 ක් ප්‍රායෝගිකව පුහුණු කරමින් සිටිනවා. පළවෙනි කාරණාව

ලෙස, හෝසා පැවැත්වීම. ගිය අවුරුද්දේ සෑම දෙයක්ම නැවතුන වෙලාවේ, කුමක් කරන්නේද කියා කනස්සල්ලෙන් පසු වුණා. සමාජ මාධ්‍ය භාවිතා කර පණිවිඩ හුවමාරු කල අතර, ලියුම් සහ නත්තල් සුභ පැතුම් පත් සකසා තැපැල් කරමින්, සාමාජිකයින්ගේ කනස්සල්ල යම්දුරකට හෝ අඩු කිරීමේ අරමුණින් විවිධ ක්‍රියාකරකම් සිදුකර බැලුවා. එවිට පවුල් අධ්‍යාපන කණ්ඩායමේ සාමාජිකයන් මවක් ලෙස වෙනස්වීම් වලට සාර්ථකව මුහුණ දෙමින් කටයුතු කරන ආකාරය දැක ගැනීමට හැකි වුනා. ඒ කාරණාව සිහියට නැගුණ වෙලවේ, පවුල් අධ්‍යාපන කණ්ඩායමට අනිවාර්යයෙන්ම ZOOM හෝසා පවත්වන අභියෝගය භාරගත හැකිය කියා සිතා කියෝකයිචෝ සාන් සමග සාකච්චා කලා. හෝසා තුලදී, තමාට තනිවම දැක ගැනීමට නොහැකි වූ 'ස්තූති වන්ත හැගිම' ගැන ඉගෙන ගන්නට පුලුවන්. එ තුල, කදුළු සලමින් කතාබහ කරන සාමජිකයින්ගේ මුහුණු ආලෝකමත්වී සිනහව පැමිණෙන ආකරය, ඇහුම්කන් දෙමින් එකට කදුළු සලන යහළුවන්ගේ හැසිරීම දැකගන්න පුලුවන්. අපිට සාමාජිකයන්ගේ දුකට සැබැහින් ලගින් සිටීමට නොහැකි වුනත්, ඔවුන් සමග බැදී සිටීමට හැකිවී තිබෙනවා. හෝසා තුලින්, උදේ සවස හමුවන සාමාජිකයන්ගේ සතුට ප්‍රාර්ථනා කරන විට, පුදුම සහගත ලෙස බුදුන් වහන්සේගේ ආශිර්වාදය අත්විදිමටත් හැකියාව ලැබුනා. අපි ප්‍රාර්ථනා කරන ලෝකය තුල වුවද, එකිනෙකා සමග සහ සම්බන්ධ වී කටයුතු කල හැකිය යන්න හොදින්ම හදවතට දැණුන මොහොතක් වුණා.

දෙවන කාරණය ලෙස 'මමෙ කැෆේ (දිළිදු දරුවන් වෙනුවෙන් නොමිලේ ආහාර ලබාදෙන ආපන ශාලව) විවෘත කිරීම සදහා ප්‍රාර්ථනා කිරීම.' මෙය 2018 වර්ෂයේ සිට පවුල් අධ්‍යාපන කණ්ඩායම විසින් පවත්වගෙන ආ මමෙ කැෆේ, කොරෝනා වෛරසය හේතුවෙන් පවත්වන්නට නොහැකි වූ කාලයේ සිට ආරම්භ වූවක්. සෑම මාසයකම මෙම ප්‍රදේශයේ 40 කටත් වැඩි පිරිසක් පැමිණෙමින් සිටි නිසාවෙන්, මෙ වෙලාවේ උදවු කලයුතු වුවත් කිසිවක් කරගත නොහැකිව කනස්සල්ලෙන්, මේ සදහා කුමක් කල හැකිද යන්න, කණ්ඩායම් උප නායිකාව සමග සාකච්චා කර බැලුවා. එහි ප්‍රතිඵලයක් ලෙස 'ළමුන් වෙනුවෙන් සූත්‍ර සජ්ජායනය කරමු! ප්‍රර්ථනා කරමු!' යන අදහස් ලැබුණා. පවුල් අධ්‍යාපන කණ්ඩායමේ සාමාජිකයින් තම තමන්ගේ නිවෙස්වල බුදුන් වහන්සේ ඉදිරිපිට ළමුන් වෙනුවෙන් ප්‍රාර්ථනාවන් එක් කරන ආකාරය ගැන සිතින් මවාගත් කළ, තව තවත් ව්‍යාප්ත කිරීමට හැකිනම්, 'මමෙ කැෆේ' නැවත විවෘත කිරීමේ ප්‍රාර්ථනාවට අනිවාර්යයෙන්ම බුදුන් වහන්සේගේ ආශිර්වාදය ලැබේවි! කියා සිතුවා. හැමදම ලෝකය වෙනුවෙන් ප්‍රාර්ථනාවන් එක් කරන කෝෂෝ නිවානෝ මැතිණිය වගේ, ලෝකයම විශ්වාස කරන ලෙස ප්‍රාර්ථනාවන් කල හැකි, පවුල් අධ්‍යාපන කණ්ඩායමක් නිර්මාණය කල යුතුයි කියා සිතමින්, උප නායිකාවන් සමග එකතුවී අදහස් එකිනෙක එකතු කර, ප්‍රාර්ථනා වැකියක් නිර්මාණය කළා. පසුව එය, දිලිදුකමින් පෙළෙන දරුවන් වෙනුවෙන් පමණක් නොව, සෑම දරුවකුගේම සතුට ප්‍රාර්ථනා කරන ප්‍රාර්ථනා වැකියක් බවට පත් වූවා. ධර්ම ශාඛාව තුළ පවත්වන 'මමෙ කැෆේ' ඉතාමත් අගනා කාර්යයක් වන අතර, අපට නොපෙනෙන මානයේ සිටින සියලූම දරුවන්ගේ සතුට හදවතින්ම ප්‍රාර්ථනා අපි, මිනිසුන් ලෙස ධර්මයේ හැසිරෙන්නන් ලෙස විශාල පියවරක් ඉරියට තබමින් සිටිනවා කියා මා සිතනවා. මෙවර ගිම්හානයේදී ධර්ම ශාඛාව ඉදිරිපිටදී, සකසන ලද ආහාර වෙනුවට වියළි ආහාර බෙදදෙන වැඩසටහනක් ලෙසින් (මමෙ කැෆේ) නැවත ආරම්භ කිරීමට කටයුතු සූදනම් කර තිබූ නමුත්, නැවතත් කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය වැඩිවීමත් සමග සියලුදෙනා සාකච්චා කර එය කල් දැමීමට තීරණය කලා. නමුත්, අපි උත්සහය අත් නොහරිමු. කෙදිනක හෝ මමෙ කැෆේ නැවත විවෘත කල හැකි දිනයක් පැමිණෙන තුරු, අපි හදවතින්ම සූත්‍ර සජ්ජායනය කරමු.

කොගනෙයි ධර්ම ශාඛාවේ, දොරටුවෙන් ඇතුල් වන විටම නිර්මාතෘ තුමාගේ විශාල පින්තූරයක් පෙනෙන්නට තියනවා. 'මමෙ කැෆේ' සදහා පැමිණෙන ළමුන් 'මෙ සීයා කවුද? කියා ප්‍රශ්න අසනවා. 'මෙ සීයා තමයි රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය නිර්මාණය කලේ' කියා පහදා දුන් විට පුදුමයෙන් 'ඇත්තමද' කියා පවසනවා. ළමුන් කිහිප දෙනෙක්ම මෙලෙස මා සමග කතා කලා. නිර්මාතෘ තුමා නිර්මාණය කල ධර්ම ශාඛා තුලින් වැට කඩුළු බිඳ දමමින් සෑම කෙනෙකු සමගම සහයෝගීතාවයෙන්, සියළු දෙනාවම බෝධිසත්වයන් බවට පත් කරන තෝතැන්නක් බවට පත් වී තිබෙනවා යැයි සිතෙන විට මට මහත් සතුටක් දැනෙනවා. නිචිකෝ නිවානෝ තුමාගේ අවුරුදු පණිවිඩය තුල 'පියා යනු දරුවන්ගේ ගෞරවයේ මූර්තියයි. මව යනු දයාවේ මූර්තියයි'ලෙස අපිට කියා දේ. මමත් එවන් මවක් විය යුතුයි කියා සිතනවා. දරුවන්ට තෝතැන්නක් වැනි පවුලක් නිර්මාණය කිරීම අරමුණු කරගෙන, පවුල් අධ්‍යාපන කණ්ඩායමේ සාමාජියයින් සමග කටයුතු කරමින් සිටිනවා. එසේම, හැකිතරම් පිරිසකට ධර්මය ඉගැන්විය හැකි පුද්ගලයකු වීමට අධිෂ්ඨාන කරමි.

බොහොම ස්තූතියි.



කිනොෂිතා සාන්ගේ පවුලේ සාමාජිකයින්

# රිෂ්ෂෝ කෝසෙයි කායි හැඳින්වීම

## නික්යෝ නිවානෝ තුමාගේ ජීවිත කතාව සහ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉතිහාසය.

### සංවිධානයේ ඉගැන්වීම් මූලාශ්‍රය සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයයි

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉගැන්වීම් මූලාශ්‍රය වන්නේ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයයි. (විවිධාර්ථ සූත්‍රය, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය, සමන්තභද්‍ර බෝධිසත්වයන් මෙනෙහි කිරීම පිළිබඳ සූත්‍රය) ඒ තුල අන්තර්ගත වන සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය 'සියලු සූත්‍රයන්ගේ ප්‍රධාන සූත්‍රය' ලෙස සලකනු ලබන අතර බුදුන් වහන්සේට පැහැදිලි කිරීමට අවශ්‍ය වූ සියල්ල පැහැදිලිව විස්තර කරන සූත්‍රයයි.

බෞද්ධාගම තුල 'ජීවත් වීමේ නිවැරදි මාර්ගය, සත්‍ය' උගන්වන අතර, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ විශේෂත්වය වන්නේ, ජීවත් වීමේ නිවැරදි මාර්ගය අරමුණු කරගත් උපමා කතාවන් ඇසුරෙන් ධර්මය ප්‍රායෝගිකව පුහුණු කලයුතු ආකාරය විස්තර කර තිබීමයි. නිර්මාතෘ තුමා එම ඉගැන්වීම්, අපට තේරුම් ගැනීමට පහසු වන ආකාරයට විස්තර කලා.










ඔබේ දැනුමට

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සාමාන්‍යයෙන් 'නම් යෝ හෝ රෙන් ගේ ක්‍යයෝ' ලෙස හඳුන්වනවා. රිෂ්ෂෝ කෝසෙයි කායි අර්ථකථනය වන්නේ 'මිනිසුන්ට මේ ලෝකය තුල, දුකට නොඇලී ජීවත්වීමේ මාර්ගය පහදදෙන වටිනා ඉගැන්වීමක්' ලෙසයි.

※කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

## මියොකෝ නගනුමා තුමිය සමග එක්ව කටයුතු කිරීම




රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය සාමාජිකයින් 30 දෙනෙකුගෙන් ආරම්භ කල නමුත්, හැකිතරම් විශාල පිරිසක් දුකින් මුදවා ගැනීම සඳහා, හැමදම වගේ නිර්මාතෘ තුමා නිර්මාතෘ තුමියත් සමග මිච්බිකි සහ තෙදොරි සදහා පිටත්ව යනවා.

සීත සෘතුවේ දවසක්, නිර්මාතෘ තුමා, බයිසිකලයක් ගෙන නිර්මාතෘ තුමියවත් නංවාගෙන මිච්බිකි සදහා පිටත් වූවා. කාලය ගැනවත් සීතල ගැනවත් නොසිතාම, ගෙවල් 20 කට වැඩි පමාණයකට ගොස් තිබූ අතර, නිර්මාතෘ තුමියගේ කකුල් හොදටම සීතල වී, හිරිවැටීම නිසා, බයිසිකලයෙන් බැස්ස නමුත් එකවරම ඇවිද යාමට නොහැකිවූ බව කියනවා.


නිර්මාතෘ තුමා, නිර්මාතෘ තුමිය ගැන පවසන්නේ, 'නොපසුබස්නා පුද්ගලයෙක්' ලෙසයි.




**ඔබේ දැනුමට**

ඒ කාලයේ සාමාජික ගාස්තුව මසකට සත 20 ක්, සූත්‍ර පොත සත 50 ක්, ඔජොස්සුව යෙන් 1.30 ක්, සහ උදොන් කප් එකක් සත 80 විය. අලුතින් පැමිණෙන සාමාජිකයින් අතරින් බොහෝදෙනෙක්, සුවකල නොහැකි රෝග නිසා පිඩාවිදින සහ පවුල තුල ගැටළු නිසා දුක් විදින අයවලුන් විය.

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
(Address) 1031 Valencia Way, Pacifica, CA 94044, USA
(Mail) POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: lotusbuddhist@gmail.com
URL: https://sf-buddhism.org/

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
(Address) 2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
(Mail) POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809, Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: info@rkina.org
URL: https://www.buddhistcenter-rkina.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**在家佛教韓国立正佼成会 Korean Rissho Kosei-kai**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571 FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
**Korean Rissho Kosei-kai of Busan**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571 FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會 Rissho Kosei-kai of Taipei**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633 FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會 Rissho Kosei-kai of Tainan**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478 FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai Society of Kolkata**
89 Srirampur Road (VIP), Garia, Kolkata 700084, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai Society of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218 Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406 FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka North**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhil**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960 Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949 Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247 Email: info@rkuk.org URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230 FAX: 03-5341-1224 URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**